දුරකථනය
தொலைபேசி
Telephon
} 011-2478373
011-2573429
email dcoopdev@sltnet.lk
Web www.coop.gov.lk

ෆැක්ස්
பெக்ஸ்
Fax
} 011-2478386

විදුලි පණිවුඩ
தந்தி
Telegrams
} සමුපකොම
கூட்டுறவாளை
CREDIT

මගේ අංකය
எனது
My No
} DCD//5/1/8/CIR

ඔබේ අංකය
உமது எண்
Your No
}

දිනය
திகதி
Date
} 2014.04 29

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

තැ.පෙ. 419, නො: 330, යුනියන් පෙදෙස, කොළඹ-02

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
த.பெ. 419, இல 330,
யுனியன் ப்ளேஸ், கொழும்பு – 02

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
P.O.Box 419, No – 330,
Union Place, Colombo - 02

සියළුම පළාත් කොමසාරිස්වරුන් වෙත,

***සමුපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමිති සඳහා සුදුසු ආයෝජන කළඹ***

සමුපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමිති ලබා ගන්නා තැන්පතුවලින් ණය දීම සහ උකස් කටයුතු කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත අරමුදල් බාහිර ආයෝජනය කිරීම පිළිබඳව පළාත්බදව විවිධ ප්‍රතිපත්තිමය තීන්දු ක්‍රියාත්මක කරනු ලැබුවද මේ සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් නොමැති වීමේ අඩුපාඩුව සපුරාලනු පිණිස 2014 මාර්තු මස 03 වැනි දින රැස් වූ ජාතික නියාමන කමිටුව විසින් මීට යාකර ඇති උපදෙස් පත්‍රිකාව නිකුත් කිරීමට තීරණය කර ඇත.

බාහිර ආයතනවල ආයෝජනය පිළිබඳව නිසි ප්‍රතිපත්තියක් අනුව කටයුතු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමුපකාර ක්ෂේත්‍රයේ සමිති හා සංගම්වලට මුහුණ දීමට සිදුවූ අපහසුතා පිළිබඳව සැලකිල්ලට ගෙන ඉදිරියේ දී එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා ද විශේෂයෙන්ම තැන්පත්කරුවනගේ මුදල්වල ආරක්ෂාව සැලසීම සඳහා ද මෙහි ඇතුලත් සීමාවන්ට අනුව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කරමි.

මෙම උපදෙස් චක්‍ර ලේඛයක් ලෙස නිකුත් කර සමුපකාර සමිති හා සංගම් ඊට අනුගත කරවීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච් කරුණාරත්න
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
O/C

ඇමුණුම

සියළුම සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

2014 මාර්තු මස 03 වැනි දින රැස් වූ සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමිති පිළිබඳ ජාතික නියාමන කමිටුව විසින් ගන්නා ලද තීරණය පහත දැක්වේ.
අදාල සමුපකාර සමිති මෙම උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.
නියාමන උපදෙස් - බැ/නි/ජ/2014/01

## සමුපකාර ග්‍රාමීය බැංකු සඳහා යෝජිත ආයෝජන මාර්ග

මූල්‍ය වත්කම්වල ආයෝජන-

| අයිතමය | නිර්දේශිත උපරිමය<br>මුළු තැන්පතු වලින් සියයට ගණන | නිර්දේශිත අවමය<br>මුළු තැන්පතු වලින් සියයට ගණන |
|---|---|---|
| 1. රජයේ සුරැකුම් පත්<br>I. භාණ්ඩාගාර බිල්පත්<br>II. භාණ්ඩාගාර බැඳුම්කර<br>2. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් / ණයකර | උපරිමයක් නැත | 5% |
| 3. රජයේ වාණිජ බැංකුවල තැන්පතු හා ණයකර (මහජන බැංකුව / ලංකා බැංකුව ) | උපරිමයක් නැත | 10% |
| 4. රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති විශේෂිත බැංකුවල තැන්පතු හා ණයකර ( රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව) | උපරිමය 5%<br>එක් බැංකුවක උපරිමය 2% | - |
| 5. අර්ධ රාජ්‍ය සහ සියළුම පෞද්ගලික බැංකුවල තැන්පතු සහ ණයකර | උපරිමය 8%<br>එක් බැංකුවක උපරිමය 1% | - |
| 6. මූල්‍ය සමාගම්වල තැන්පතු සහ ණයකර | උපරිමය2%<br>එක් ආයතනයක උපරිමය 1% | - |
| 7. ඒකකභාර | උපරිමය2%<br>එක් භාරයක උපරිමය 1% | - |
| 8. කොටස් වෙළඳපොළ | 2%<br>එක් සමාගමක උපරිමය 1% | - |
| 9. ලැයිස්තු ගත සමාගම්වල වාණිජ පත්‍ර | උපරිමය2%<br>එක් සමාගමක උපරිමය 1% | - |
| 10. ග්‍රාමීය බැංකු සංගම්වල තැන්පතු | පළාත් කොමසාරිස් විසින් පැනවූ සීමාවන් | .. |

**මූල්‍ය නොවන ව්‍යාපාරවල ආයෝජන**

මෙම ව්‍යාපාරවල ආයෝජනය කළ යුත්තේ නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පසු ගිය වර්ෂවල ආදායම් ගණනය කිරීමෙන් පසුව පැහැදිලිවම ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයන් තිබේ නම් පමණකි. එම අතිරික්තයේ ප්‍රමාණය නොඉක්මවන සේ පළාතේ සමුපකාර කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ඇතිව පමණක් එම ආයෝජනය සිදුකළ හැකිය. එසේ නොමැතිව තැන්පත් මුදල් වැය කිරිම සිදුවන කිසිම ව්‍යාපාරික කාර්යයක් ආරම්භ නොකළ යුතුය.

සටහන් - 01. මෙම උපදෙස් අදාල වන්නේ අළුතින් සිදුකෙරෙන ආයෝජන සහ දැනට තිබෙන ආයෝජන කල්පිරීමෙන් පසුව සිදුකෙරෙන ආයෝජන සඳහාය.

02. මෙම උපදෙස් සැමවිටම සමුපකාර පනතේ සහ පළාත් සභා ප්‍රඥප්තිවල ඇති විධිවිධානයන්ට යටත්වේ.

03. ඉහත සඳහන් 4, 5, 6 සහ 9 යන අයිතමයන්ට අදාල ආයෝජන තෝරා ගැනීමේ දී ණය ශ්‍රේණි ගත කිරීමේ ආයතනයක් විසින් නිකුත් කරන ලද A -ශ්‍රේණිය හෝ ඊට වැඩි අගයක් ඇති ආයතන තෝරා ගත යුතුය. යම් ආයතනයක තැන්පතු හෝ ණයකර සම්බන්ධයෙන් යම් බැංකුවක් විසින් ඇප වී හෝ භාරකරු වී ඇති විට එම ඇපකරු හෝ භාරකරු වී ඇතිබැංකුවට අදාල ශ්‍රේණිය සලකා බලා නිගමනයකට එළඹීම යෝග්‍ය වේ.

04. මෙහි දක්වා ඇති නිර්දේශයන්ට අනුව ආයෝජන කටයුතුවල නියුක්ත වී ඇති දිස්ත්‍රික්ක ග්‍රාමීය බැංකු සංගම්වල සහ වෙනත් ජාතික මට්ටමේ සමුපකාර ආයතනයක මුදල් තැන්පත් කිරීම පළාත් සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය මත සිදුවිය යුතුය. එසේම අවම වශයෙන් ඉහත සඳහන් 1,2 සහ 3 යටතේ කළ යුතු ආයෝජනයන් බැංකු සංගම් මාර්ගයෙන් කිරීම සමුපකාර කොමසාරිස්ගේ අවසරය අනුව කළ හැකිය.

ඩබ්ලිව්.එච්. කරුණාරත්න
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්